**<u>දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින ඉංග්‍රීසි විෂය ගුරු පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 – I (ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම - (2021)2024</u>**

**<u>සුදුසුකම්ලත් අයදුම්කරුවන් ස්ථානගත කිරීම සඳහා අයදුම්පත්‍රය</u>**

**<u>Recruitment of Diploma Holders to Grade 3 – I (C) of the Sri Lanka Teachers' Service for the English Teacher vacancies in National & Provincial Schools - 2021(2024)</u>**

**<u>Application for the Placement</u>**

**<u>நாட்டின் தேசிய மற்றும் மாகாணப் பாடசாலைகளில் நிலவும் ஆங்கிலப் பாட ஆசிரியர் வெற்றிடங்களுக்காக டிப்ளோமாதாரிகளை இலங்கை ஆசிரியர் சேவையின் தரம் 3- I (இ) இற்கு ஆட்சேர்த்தல் – (2021) 2024</u>**

**<u>தகுதி பெற்ற விண்ணப்பதாரர்களை நிலைப்படுத்துவதற்கான விண்ணப்பப் படிவம்</u>**

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින ඉංග්‍රීසි විෂය ගුරු පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 – I (ඇ) ශ්‍රේණියට බඳවා ගැනීමට අදාළව 2021.12.12 දින පැවැති විවෘත තරඟ විභාගයේ හා 2024.05.10, 11, 13 හා 20 යන දිනයන්හි පැවැති ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම්ලත් ඩිප්ලෝමාධාරීන්ට පත්වීම් ලබාදීම සඳහා වන තොරතුරු රැස්කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට නියමිතය.

ඒ අනුව **teacher.moe.gov.lk** ඔස්සේ එහි ඇති උපදෙස් පරිදි **2024.06.24** දින සිට **2024.06.26** දින දක්වා එම අදාළ තොරතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.

## සැලකිය යුතුයි.

I. එක් අයදුම්කරුවෙකුට මාර්ගගත පද්ධතියට පිවිසීමට පරිශීලක නාමය (user name) ලෙස ජාතික හැඳුනුම්පත් අංකය හා මුරපදයක් (password) භාවිතා කර පරිශීලක ගිණුමක් විවෘත කළ යුතු අතර, ස්ථානගත කිරීම සම්බන්ධ තොරතුරු ලබා දෙන තෙක් පද්ධතියට පිවිසීම සඳහා එම පරිශීලක නාමය හා මුරපදය ඔබ සතුව පැවතීම අත්‍යාවශ්‍ය වේ.

II. එසේම මාර්ගගත පද්ධතියට පිවිස අයදුම්පත සම්පූර්ණයෙන්ම පුරවා එය පද්ධතියට ඇතුළත් කළ පසු (submit) නැවත සංශෝධනය කිරීමට අවස්ථාව ලබා නොදෙන බැවින් උපදෙස් මාලාව හොඳින් කියවා දත්ත ඇතුළත් කිරීම සිදු කළ යුතුය.

III. කෙසේ නමුත් ගිණුමේ පරිශීලක නාමය (user name) හා මුරපදය (password) භාවිතා කර මාර්ගගත පද්ධතිය විවෘතව පවතින කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවක ඔබගේ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය පරීක්ෂා කිරීමට හැකියාව ඇත.

IV. ස්ථානගත කිරීමේදී ඔබ විභාගයට අයදුම් කරන ලද පළාතට අදාළ පුරප්පාඩු පවතින ජාතික පාසල් හා එම පළාතේ පුරප්පාඩු පවතින පළාත් පාසල් වෙත ඔබගේ <u>කුසලතා අනුපිළිවෙළ</u> සැලකිල්ලට ගනිමින් පමණක් ස්ථානගත කිරීම් සිදු කරනු ලැබේ.

V. තවද තහවුරු කර ගත් පුරප්පාඩු සඳහා පමණක් ස්ථානගත කිරීම් සිදු කරනු ලබන අතර, විදුහල්පතිවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ලිපි කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

VI. පළාත් පසල් සඳහා පත්වීම් ලැබීමට අපේක්ෂා කරනු ලබන පත්වීම්ලාභින්ගේ නාම ලේඛන අදාළ පළාත් වෙත යොමු කරනු ලබන අතර, ඒ අනුව ඔවුන්ට පත්වීම් ලිපි නිකුත් කිරීම හා ස්ථාන ගත කිරීම අදාළ පළාත් අධ්‍යාපන ලේකම් විසින් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් සිදු කරනු

ඇත. ඔවුන් අයත් පළාත් පාසල් වෙත පුරප්පාඩු අනුව ස්ථානගත කිරීම පළාත් අධ්‍යාපන ලේකම් විසින් සිදු කරනු ලබයි.

VII. **ඉහත සඳහන් කරනු ලැබූ ක්‍රමවේදය දැඩිව අනුගමනය කරමින් ලිඛිත විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රතිඵලවල කුසලතාවයේ අනුපිළිවෙලින් මාර්ගගතව (online) පදනම්ව පමණක් ස්ථානගත කිරීම් සිදු කරන බැවින්, ඔබ අපේක්ෂා කරන සේවා ස්ථානයටම පත්වීම් ලබා දෙන බවට පොරොන්දු ලබා දෙමින්, මුදල් ලබා ගැනීම සඳහා උත්සාහ කරන වංචනික පුද්ගලයන්ට හසුවීමෙන් වලකින ලෙස විශේෂයෙන් අවධාරණය කරනු ලැබේ.**